# පරීක්ෂක වාර්තාව

**අදියර II විභාගය - 2022 ජනවාරි**

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

---

## A - කොටස

### ප්‍රශ්න අංක 01

මුළු ලකුණු 25 ක් වෙන්කළ වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න 14 කින් මෙම ප්‍රශ්නය සමන්විත විය.

අයදුම්කරුවන් බොහෝ දෙනෙකු මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණි. මෙම ප්‍රශ්නයට වෙන් කළ ලකුණු වලින් අඩකට වඩා අයදුම්කරුවන් බොහෝ දෙනෙකු ලබාගෙන තිබුණි. ඔවුන් අතුරෙන් සමහරු ප්‍රශ්නය සඳහා වෙන්කර තිබූ මුළු ලකුණු වලින් ලකුණු 20 කට වඩා උපයාගෙන තිබුණි. ප්‍රශ්න අංක **1.4, 1.6, 1.9, 1.11,** සහ **1.14** සඳහා නිවැරදි ලෙස උත්තර ලිවීමට අයදුම්කරුවන්ගෙන් සැහෙන ගණනක් අපොහොසත් වූ බව දක්නා ලදී. සේවක භාරකාර අරමුදල, පාරිතෝෂික ගෙවීම් පනත යටතේ බැහැර කරන ලද සේවක භාණ්ඩ සහ CIF ගිවිසුම පිළිබඳව බොහෝ අයදුම්කරුවන්ට දැනුමක් තිබී නැත. තවද අන්තර්ජාතික වෙළඳ ආරවුල් පිළිබඳව ද අයදුම්කරුවන් බොහෝ දෙනෙකුට දැනුමක් තිබී නැත. අයදුම්කරුවන් බොහෝ දෙනෙකු සේවකයා හා ස්වාධීන කොන්ත්‍රාත්කරු අතර වෙනස හඳුනාගැනීම සඳහා භාවිතා කළ හැකි ලක්ෂණද හඳුනා දක්වා නොතිබුණි.

**A කොටස** සඳහා ලකුණු ලබා ගැනීම පිණිස අයදුම්කරුවන්ට සිවිල් නීතිය, භාණ්ඩ විකිණීමේ ආඥාපනත, ව්‍යවස්ථාපිත නීති, ගිවිසුම් නීතිය, අන්තර්ජාතික නීති සහ කම්කරු නීතිය පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නයෙන් හවුල් ව්‍යාපාර පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක්කර ඇත. මෙය තරමක පහසු ප්‍රශ්නයකි. අයදුම්කරුවන් බොහෝ දෙනෙකු කොටස් දෙකටම නිවැරදි පිළිතුරු ලියා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 03

2006 අංක 6 දරණ මූල්‍ය ගණුදෙනු වාර්තාකරණ පනත සහ 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත මත මෙම ප්‍රශ්නය පදනම් වී තිබුණේය. අයදුම්කරුවන් බොහෝ දෙනෙක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණු නමුත් මෙම පනත් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නොතිබීම හේතුවෙන් වැරදි උත්තර ලියා තිබුණි. ප්‍රශ්නයේ **(b) කොටස** (බුද්ධිමය දේපළ පනත) සඳහා වූ උත්තර සාමාන්‍යයෙන් සතුටුදායක මට්ටමක විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 04

රක්ෂණ නීතිය පිළිබඳව දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර ඇත. මෙය රක්ෂණ නීතිය පිළිබඳ තරමක් සරළ ප්‍රශ්නයකි. අයදුම්කරුවන් බොහොමයක් නිවැරදි පිළිතුරු ලියා තිබුණි. රක්ෂණ හිමිකම් හා උපරිම විශ්වාසය යන සංකල්ප ගැන බොහෝ දෙනා සඳහන් කර තිබුණි. එහෙත් සමහරු මෙම සංකල්පය ගැන සඳහන් කර තිබුණේ නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 05

මෙය ගනුදෙනු කළ හැකි ලියවිලි මත පදනම් වූ ප්‍රශ්නයකි. අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නය සඳහා උත්තර සපයා තිබූ අතර ප්‍රශ්නයේ **(a) කොටසට** අඩක් නිවැරදි උත්තර ලියා තිබුණි. බොහෝ අයදුම්කරුවන් ප්‍රමාණයක් **(a)** සහ **(b) කොටස්** සඳහා නිවැරදි උත්තර ලිවීමට අසමත් වී තිබුණි. අයදුම්කරුවන් සුළු ප්‍රමාණයක් **(a) කොටස** සඳහා නිවැරදිව උත්තර සැපයීමට අපොහොසත් වී තිබුණි. බොහෝ අයදුම්කරුවන්ට ගනුදෙනු කළ හැකි ලියවිලි පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් තිබී නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නයෙන් නියෝජ්‍යත්ව නීතිය පිළිබඳ දැනුම පරීක්ෂාකර ඇත. මෙය අවශ්‍යතා නියෝජත්වයට අදාල තරමක් සරල ප්‍රශ්නයකි. අයදුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකු මෙම ප්‍රශ්නයට නිවැරදිව උත්තර ලියා තිබුණි. ඔවුන් අතුරෙන් බහුතරය අවශ්‍යතා නියෝජ්‍යත්වයක් පැවතුනු බව සඳහන් කර තිබුණි. සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමේ කාර්යභාරය සතුටු දායක යැයි කිවහැකිය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## C කොටස

## ප්‍රශ්න අංක 07

කොටස් දෙකකින් සමන්විතය.

**(A) කොටස**

**ගිවිසුම් නීතිය මත පදනම්වී තිබුණි.**

**(a)** අයදුම්කරුවන් බොහෝමයක් නිවැරදි උත්තර සපයා තිබුණි.

**(b)** අයදුම්කරුවන් බොහෝමයක් නිවැරදි උත්තර ලිවීමට අපොහොසත් වී තිබුණි.

**(c)** බොහෝ අයදුම්කරුවන් නිවැරදි උත්තර ලිවීමට අසමත් වි තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය අසතුටුදායක මට්ටමක විය.**

**(B) මෙම කොටස භාණ්ඩ විකිණීමේ ආඥාපනත මත පදනම්වී තිබුණි:**

අයදුම්කරුවන් බොහොමයක් මෙම කොටසට නිවැරදි උත්තර ලිවීමෙන් අදාල ව්‍යංග කොන්දේසි ගැන සඳහන් කර තිබුණි. බොහෝ අයදුම්කරුවන් භාණ්ඩ විකිණීමේ ආඥාපනත පිළිබඳව හොඳ තිරසාර දැනුමක් තිබුණු බව පෙණුනි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සාමාන්‍ය සතුටුදායක මට්ටමට වඩා ඉහළින් පැවතුණි. අයදුම්කරුවන් බොහෝමයක් ප්‍රශ්නයට වෙන්කර තිබූ මුළු ලකුණු වලින් අඩකට ආසන්න ප්‍රමාණයක් ලබාගෙන තිබුණි. කීප දෙනෙකු ප්‍රශ්නයට වෙන්කළ මුළු ලකුණු වලින් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි. සාමාර්ථවීමේ ලකුණු මට්ටමට එය බෙහෙවින් දායක වි ඇත.

- - -

<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමුකළ යුතු පොදු කරුණු:</u>

(1) නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්න තුල භාවිත කර ඇති කළයුතු ක්‍රියාව තුලින් බලාපොරොත්තුවන උත්තර ක්‍රියා නිර්වචනයට අනුකූලවන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.

(4) ස්ව-අධ්‍යන පාඩම්මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ව්‍යාපාර නීතිය හා අචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංක /විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂාකර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -